

ශීර්ෂ අංක 04 - කාර්ය සාධන වාර්තාව 2021

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

செலவுத்தலைப்பு இல.04 - செயலாற்றுகை அறிக்கை 2021

உயர் நீதிமன்ற நீதியரசர்கள்

PERFORMANCE REPORT 2021 - HEAD 04

JUDGES OF THE SUPERIOR COURT

2021 වසර සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
උපරිමාධිකරණ විනිශ්චයකාරවරු - ශීර්ෂ අංක 04

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04- කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.a ශ්‍රේෂ්ඨාධිකරණය

1. a 1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉහලම හා අවසානාත්මක අධිකරණ බලය ඇති ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණය වේ. ශ්‍රේෂ්ඨාධිකරණය අග්‍රවිනිශ්චයකාරතුමා සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් 16 දෙනෙකු ගෙන් යුක්ත වේ. එකී සියලුම විනිසුරුවරුන් ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබේ. අනෙකුත් සියලුම අධිකරණ පිලිබඳ අවසාන අභියාචනාධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන අතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල ක්‍රියාත්මක කෙරේ.

1. a 2 ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව (පනත, භාර ඔප්පුව, වෙනත්)

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ XVI වන පරිච්ඡේදයේ ජ්‍යෙෂ්ඨ අධිකරණ යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ නෛතික රාමුව හඳුන්වා දී ඇත. එකී ව්‍යවස්ථාවේ 118 සිට 136 වන ව්‍යවස්ථාව දක්වා ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය සහ සංයුතිය ඇතුළු කාර්ය භාරය සඳහන් කර ඇත.

ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කල 20 වන සංශෝධනය මගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය අග්‍රවිනිශ්චයකාරවරයාගෙන්ද වෙනත් විනිශ්චයකාරවරයන් 06 දෙනෙකුට නොඅඩු සහ 16 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වියයුතු බවට 119 වන ව්‍යවස්ථා සංශෝධනය කර ඇත.

1. a 3 ආයතනයේ පරමාර්ථ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ලබාදී ඇති බලතල ක්‍රියාත්මක කරමින් කාර්යක්ෂමව යුක්තිය පසිඳලීම.

1. a 4 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැමිණ ඇති බලතල ක්‍රියාත්මක කරමින් කාර්යක්ෂමව යුක්තිය පසඳලීම තුලින් ශ්‍රී ලාංකික ජනතාවගේ විශ්වාසය සුරක්ෂිත කිරීම හා එමගින් ජනතා අභිවෘද්ධිය සැලසීම."

අවම කාලයක් තුල කාර්යක්ෂමව ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කරමින් යුක්තිය පසඳලීමට කටයුතු කිරීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පහත සඳහන් බලතල ශ්‍රේෂ්ඨාධිකරණයට පවරනු ලැබ ඇත්තේය.

- මූලික අයිතිවාසිකම් පිලිබඳ අධිකරණ බලය
- අවසාන අභියාචනා අධිකරණ බලය.
- උපදේශක අධිකරණ බලය.
- ජනාධිපතිවරණ පෙත්සම පිළිබඳ අධිකරණ බලය
- කවර හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංගනය කිරීම පිළිබඳ අධිකරණ බලය.
- පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණා පිළිබඳ අධිකරණ බලය.

1. a 5 ප්‍රධාන කාර්යයන්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කටයුතු සම්බන්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.
- මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.
- අවසාන අභියාචනාධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.
- උපදේශාත්මක අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.
- මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සහ කවරමය ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.
- පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබඳ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.
- නීතීඥ මහතුන් ඇතුළත් කර ගැනීම, බඳවා ගැනීම, අත්හිටුවීම සහ ඉවත් කිරීම.

මෙම වැය ශීර්ෂය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ ගරු විනිසුරුතුමන්ලාට වැටුප් හා චේතන ගෙවීම, අනෙකුත් පුනරාවර්ථන වියදම් ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සහ විදේශ සම්මන්ත්‍රණ හා සමුළු සඳහා ප්‍රතිපාදන ඇතුළත් කෙරේ.

1. a 6 සංවිධාන සටහන

අදාල නොවේ.

1. a 7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

නොමැත.

1.b අභියාචනාධිකරණය

1. b 1 හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභියාචනාධිකරණය ශ්‍රී ලංකාවේ අධිකරණ ධූරාවලියේ ජ්‍යෙෂ්ඨත්වයෙන් දෙවන ස්ථානයේ වූ අධිකරණ බලය ක්‍රියාත්මක කරන විනිශ්චයාධිකරණයකි.

අභියාචනාධිකරණයේ ගරු විනිශ්චයකාරතුමන්ලා 20 දෙනෙකුගෙන් යුක්ත වන අතර එකී විනිශ්චය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුතුමා ක්‍රියා කරයි.

යම් කිසි මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින් සිද්ධි පිළිබඳව හෝ නීතිය පිළිබඳව හෝ කරන ලද සියළුම වැරදි නිවැරදි කිරීම සඳහා අභියාචන අධිකරණ බලය ද, රිට් ආඥා නිකුත් කිරීම, ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමේ බලය, පාර්ලිමේන්තු ඡන්ද පෙත්සම් විභාග කිරීමේ බලය , මුල් අවස්ථා අධිකරණවල වාර්තා හා සෝදිසි කිරීමේ බලය හා සිරකරුවන් ගෙන්වා ගැනීමේ හා ඉවත් කිරීමේ බලය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව ක්‍රියාත්මක කරයි.

අභියාචනාධිකරණයේ සාමාන්‍යයෙන් කොළඹ දී, සිය අධිකරණ බලය ක්‍රියාත්මක කරන අතර අභියාචනාධිකරණ නඩු තීන්දුව යම් විනිශ්චය මණ්ඩලයක ඒක මතික තීරණයක් නොවන විටකදී ඒ තීන්දුව බහුතර සංඛ්‍යාවෙන් තීරණය වේ.

අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් යනුවෙන් පදවිය නම් කරනු ලබන නිලධාරියකුගේ භාරයේ පවතින අතර රෙජිස්ට්‍රාර්වරයා අභියාචනාධිකරණයේ සභාපතිවරයාගේ අධීක්ෂණයට, විධානයන්ට හා පාලනයට යටත් වේ.

1. b 2 ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව (පනත, භාර ඔප්පුව, වෙනත්)

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ XVI වන පරිච්ඡේදයේ ජ්‍යෙෂ්ඨ අධිකරණ යටතේ 137 වන ව්‍යවස්ථාව පරිදි අභියාචනාධිකරණයේ සංයුතියද 138 ව්‍යවස්ථාව අනුව අභියාචනාධිකරණයේ අධිකරණ බලයද, 139 සිට 147 වන ව්‍යවස්ථාව දක්වා එහි කාර්ය භාරය ද දක්වා ඇත.

ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කල 20 වන සංශෝධනය මගින් අභියාචනාධිකරණය, අභියාචනාධිකරණයේ සභාපතිවරයාගෙන්ද, වෙනත් විනිශ්චයකාරවරයන් 06 දෙනෙකුට නොඅඩු සහ 19 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වියයුතු බවට 137 ව්‍යවස්ථාව සංශෝධනය කර ඇත.

1. b 3 ආයතනයේ පරමාර්ථ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ලබාදී ඇති බලතල ක්‍රියාත්මක කරමින් කාර්යක්ෂමව යුක්තිය පසිදලීම.

1. b 4 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

"ඉදිරි නව දශකය තුල යුක්තිය පසිදලීමේ කාර්ය ඉතාම කාර්යක්ෂමව ඉටු කිරීම."

යුක්තිය පසිදලීමේ කාර්යය නඩු කියන්නන්ට උපරිම පහසුව හා කාර්යක්ෂමතාවය සැලසෙන පරිදි නව ක්‍රමවේදයන් හා පරිගණක තාක්ෂණය අනුසාරයෙන් ක්‍රියාත්මක වීම.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණවල, කම්කරු විනිශ්චය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලය ද, අභියාචනාධිකරණ බලය ද අභියාචනාධිකරණය සතුය. එසේම 2002 අංක 25 දරණ සාපරාධී කරුණුවලදී අන්‍යාන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනත සහ 2000 අංක 39 දරණ සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යාන්‍යෝන්‍ය සහයෝගය ලබා දීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීම හා ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත.

1. b 5 ප්‍රධාන කාර්යයන්

- මහාධිකරණ ඇතුලු මුල් අවස්ථා අධිකරණ තීන්දුවලට එරෙහිව ඉදිරිපත් කරන අභියාචනා සහ ප්‍රතිශෝධන අයදුම්පත් විභාග කිරීම.
- වෙනත් ව්‍යාවස්ථාපිත මණ්ඩලවල තීරණයන්ට එරෙහි අභියාචනා විභාග කිරීම.
- මුල් අවස්ථා අධිකරණ වල පවතින නඩු වෙනත් එම අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත මාරු කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත් විභාග කිරීම.
- අධිකරණයට අපහාස කිරීම් සම්බන්ධව විමර්ෂණය කිරීම.
- මැතිවරණ පෙත්සම් විභාග කිරීම.

1.b 6 සංවිධාන සටහන

අදාල නොවේ.

1.b 7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

නොමැත.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.a ශ්‍රේෂ්ඨාධිකරණය

පවත්නා මානව හා භෞතික සම්පත් විධිමත්ව කළමනාකරණය කර ගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු මෙහෙය උපරිම අයුරින් සලසාලමින් යුක්තිය පසිදලීමේ කාර්ය භාරයෙහිලා

මහජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් උපරිම මහජන සේවයක් සැලසීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ 2021.01.01 සිට 2021.12.31 දක්වා කාර්ය සාධනය					
නඩු වර්ගය	2021.01.01 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව	2021.01.01 සිට 2021.12.31 දිනට ගොනු කල නඩු සංඛ්‍යාව	2021.01.01 සිට 2021.12.31 දක්වා විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව	2021.01.01 සිට 2021.12.31 දිනට අවසන් කල නඩු සංඛ්‍යාව	2021.12.31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව
මූලික අයිතිවාසිකම්	1216	440	1656	266	1390
විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර	596	223	819	219	600
පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග	0	32	32	32	0
අභියාචනා නඩු	1237	116	1353	143	1210
වාණිජ මහාධිකරණ අභියාචන නඩු	464	28	492	32	460
මහාධිකරණ අභියාචනා අවසර ඉල්ලුම්පත්	155	78	233	43	190
රිට් ඉල්ලුම්පත්	12	12	24	09	15
පලාත්බද මහාධිකරණ අභියාචනා නඩු	884	405	1289	181	1108
ප්‍රතිශෝධන නඩු	06	01	07	03	04
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු	0	0	0	0	0
විවිධ නඩු	11	02	13	0	13
ත්‍රිපුද්ගල විනිශ්චය අභියාචනා	03	0	03	0	03
අධිකරණයට අපහාස කිරීමේ නඩු	12	01	13	06	07
Rule Matters	09	08	17	01	16
නෙරපීම් සම්බන්ධ නඩු	01	02	03	01	02
ඉක්මන් කිරීමේ නඩු	01	0	01	0	01
එකතුව	4607	1348	5955	936	5019

රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය

2.b අභියාචනාධිකරණය

අභියාචනාධිකරණයෙන් ඇසීමට ඇති සහ අසා නිම කල නඩු වර්ග හා විශාල ප්‍රමාණයක සංචිතයක් සහිතව ලේඛනාගාර 3ක් පවත්වාගෙන යනු ලබන අතර එකී ලේඛනාගාර නව ක්‍රමවේදයන් (Matter Type) අනුව නඩු වාර්තා අසුරා තැබීම හා නඩු අංක පරිගණකගත තීරු කේතකරණය කිරීමේ (Barcode) කටයුතු ආරම්භ කර ඇත.

ඒ අනුව එක් එක් නඩු වර්ග අනුව (Matter Type) නඩු වර්ග අසුරා තැබීම සිදු කිරීමෙන් අවශ්‍ය විටකදී නඩු වර්ග පරිශීලනය කිරීමට පහසු ක්‍රමවේදයක් සකස් කර ඇති අතර තීරු කේතකරණ අංකණ ක්‍රමය තුළින් (Barcode) නඩු කළමනාකරණ පද්ධතිය හා සම්බන්ධ වේ. (Case management System)

නඩු ගාස්තු, පිටපත් ගාස්තු ආදි පරිපාලනාත්මක ගාස්තු අය කිරීමේදී පරිගණක ගත මෙහෙයුම් පද්ධතිය මඟින් කුවිතාන්සි නිකුත් කිරීම ආරම්භකර ඇත. එමෙන්ම අදාල ගිණුම් වාර්තා සකස් කිරීම අදාල පරිගණකගත මෙහෙයුම් පද්ධතිය මඟින් ස්වයංක්‍රීයව සකස් කිරීමට කටයුතු යොදා ඇත.

අභියාචනාධිකරණයේ ලැයිස්තුගත අංශය නඩු ගොනු කළමනාකරණ පද්ධතිය නව මෙහෙයුම් පද්ධතියක් මඟින් යථාවත් කර ඇත. (Case management System) ඒ අනුව වඩාත් නිවැරදිව හා කාර්යක්ෂම ලෙස නඩු ලැයිස්තුගත කිරීම, වෙබ් පිටුව පවත්වාගෙන යෑම, නඩු කියන්නන්ගේ දැන ගැනීම සඳහා කැඳවීම් නඩු පිළිබඳ විස්තරයක් දර්ශකයක් (Display) මඟින් දිනපතා යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ.

ලැයිස්තුගත කිරීමේ අංශය, රෙජිස්ට්‍රාර්වරයා, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරු හා සියළුම ලේඛනාගාර නඩු ගොනු කළමණාකරණ පද්ධතිය මඟින් ජාලගතකර ඇත. එමඟින් අදාළ නිලධාරීන් ඕනෑම නඩු වාර්තාවක විස්තර පරිශීලනය කිරීමට අවස්ථාව හිමි වී තිබේ. මෙය නීතීඥ මහතුන් හා අනෙකුත් නඩු කියන්නන්ගේ පරිශීලනය දක්වා ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් සිටී.

වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී මහජන සේවාවන් සඳහා අභියාචනාධිකරණයේ නඩු ගොනු පරිගණකගත විද්‍යුත් ලේඛන (e – Format) බවට පරිවර්තනය කිරීම හා පරිගණකගත මාර්ග ගත ක්‍රම මඟින් නඩු කටයුතු (e – filing) පවත්වා ගෙන යෑම.

අභියාචනාධිකරණයේ නිල වෙබ් පිටුව නවීකරණය කිරීම හා නව ජංගම දුරකථන යෙදවුමක් (Mobile Application) හඳුන්වාදීම හා එමඟින් නඩු කටයුතු සම්බන්ධව තොරතුරු ප්‍රගාමීව ප්‍රදර්ශනය කිරීම. (proactively disclose)

අභියාචනාධිකරණ කාර්යාලය , විනිසුරු නිල මැදිරි, විවෘත අධිකරණ යන සියළුම අංශ පරිගණක ජාලගත කිරීම තුළින් ලිපි ගොනු භෞතිකව සංසරණය වීම අවම කිරීම (Paper less Documents Circulation)

අභියාචනාධිකරණයේ **2021.01.01 සිට 2021.12.31 දක්වා කාර්ය සාධනය**					
	නඩු වර්ගය	**2021-01-01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව**	**2021-01-01 සිට 2021-12-31 දක්වා ලියාපදිංචි නඩු සංඛ්‍යාව**	**2021-01-01 සිට 2021-12-31 දක්වා තීරණය වූ නඩු සංඛ්‍යාව**	**2021-12-31 දිනට විසඳීමට ඇති ඉතිරි නඩු සංඛ්‍යාව**
01	රිට් අයඳුම්පත්	1230	650	518	1362
02	මහාධිකරණ අභියාචනා (අපරාධ)	1062	233	248	1047
	(වාණිජ)	05	-	-	05
03	පළාත්බද මහාධිකරණ අභියාචනා	916	76	109	883
04	සිවිල් අභියාචනා	77	-	34	43
05	පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත්	183	131	92	222
06	ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පත්	31	12	02	41
07	බදු අභියාචනා (TAX)	220	32	59	193
08	වෙනත් අයදුම්පත්	259	123	209	173
09	එකතුව	3983	1257	1271	3969

රෙජිස්ට්‍රාර් - අභියාචනාධිකරණය

පරිච්ඡේදය 03 – වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 රාජ්‍ය අංශය සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති අංක 01 මගින් නියම කර ඇති ආකෘතියට අනුව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතී නම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

පරිත්‍යාග සහ වෙනත් ලැබීම් නොමැත

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

මූල්‍ය නොවන වත්කම් නොමැත

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

`

3.1 රාජ්‍ය අංශය සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති අංක 01 මගින් නියම කර ඇති ආකෘතියට අනුව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන



ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		389,630,500	226,755,307	ඒසීඒ-3
-	තැන්පතු		-	-	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		539,924	399,876	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		390,170,424	227,155,183	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		390,170,424	227,155,183	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		20,083,031	519,948	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		370,087,393	226,635,235	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
182,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	293,018,121	177,674,456	
67,150,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	66,443,575	40,531,917	ඒසීඒ-2(ii)
200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	182,952	103,771	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
249,850,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		359,644,649	218,310,144	
	මූලධන වියදම්				
1,150,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	1,891,250	
3,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	14,978,868	8,156,231	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
50,000,000	හැකියා වර්ධනය	14	1,396,765	2,751,942	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
54,150,000	මුළු මූලධන වියදම් (උ)		16,375,634	12,799,423	
	තැන්පතු ගෙවීම්		-	-	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		581,000	1,832,742	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		581,000	1,832,742	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		376,601,283	232,942,309	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(6,513,890)	(6,307,074)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(6,513,890)	(6,307,072)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසීඒ-3
			(6,513,890)	(6,307,072)	

Scanned with CamScanner

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	ඒසිඒ-6	609,890,812.82	594,911,944.61
මූල්‍ය වත්කම්			
අන්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	2,022,301.00	1,981,255.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	186,640.13
මුළු වත්කම්		611,913,113.82	597,079,839.74
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		2,022,301.00	1,981,255.00
දේපළ පිරියන හා උපකරණ සංචිතය		609,890,812.82	594,911,944.61
කුලී හා වැඩ අන්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අයිම ශේෂය	ඒසිඒ-3	-	186,640.13
මුළු වගකීම්		611,913,113.82	597,079,839.74

පිටු අංක 01 සිට 30 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුනිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ප්‍රදීප් මහමුතුගල
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ප්‍රදීප් මහමුතුගල
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර් 2
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2022/02/21

ආර්.ඒ.ඇයි.ජේ.රණතුංග
ප්‍රධාන ගණකාධිකාරි
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ - 12.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
			නැවත ගණන
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්		6,410,890	4,474,330
අග්‍රිම ලැබීම්		389,630,500	226,755,307
අන්තිකාරම් අයකර ගැනීම්		436,924	399,876
තැන්පතු ලැබීම්		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**396,478,314**	**231,629,513**
අඩුකළා : මුදල් වැය කිරීම්			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		359,461,697	218,206,373
සහනාධාර සහ මාරුකිරීම්		182,952	103,771
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්		-	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		20,083,031	519,948
අන්තිකාරම් ගෙවීම්		375,000	
තැන්පතු ගෙවීම්		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**380,102,680**	**218,830,092**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**16,375,634**	**12,799,422**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
ගිවිසුම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා හෞනික වත්කම් විකිණීම්		-	-
උපාය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
හෞනික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්		16,375,634	12,799,422
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		16,375,634	12,799,422
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		**(16,375,634)**	**(12,799,422)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		0	(0)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		0	(0)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන(පවතීනම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
ශ්‍රේෂ්ඨාධිකරණය				
පුනරාවර්තන	126,950	183,100	167,215	91.32%
ප්‍රාග්ධන	27,100	49,400	7,738	15.66%
අභියාචනාධිකරණය				
පුනරාවර්තන	122,900	213,950	192,430	89.94%
ප්‍රාග්ධන	27,050	52,500	8,638	16.45%
මුළු ප්‍රතිපාදනය				
පුනරාවර්තන	249,850	397,050	359,645	90.58%
ප්‍රාග්ධන	54,150	101,900	16,376	16.07%

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

නැත.

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**2021.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2021.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	609,890	609,890	-	100%

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව -

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } JLO/B/SC/FA/2021/48/B ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 මැයි 19 දින

රෙජිස්ට්‍රාර් (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී)
උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු

ශීර්ෂය - 04, උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව හා මුල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත : 1.අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

THE DEPUTY REGISTRAR
SUPREME COURT
19 May 2022
recd at 4.05 p.m.
SRI LANKA

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/SC/FA/2021/48/B ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි ෑ දින

රෙජිස්ට්‍රාර් (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී)

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුහි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

මූල්‍ය නොවන වත්කම්

භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ SA - 82 හි මූල්‍ය නොවන වත්කම්වල ශේෂයක් දක්වා නොතිබුණත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ සහ එහි සංචිතය ලෙස රු.609,890,813 ක් දක්වා තිබුණි. එය ආයතනයේ සිගාස්වල ඇතුලත් වත්කම් වාර්තාවේ වටිනාකම විය. ඒ අනුව 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.2 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා සමඟ එකඟවන බවට සහතික වී නොතිබුණි. එසේම 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 02 හි සඳහන් පරිදි භාණ්ඩාගාර මාසික ගිණුම් ප්‍රකාශනයන් සමඟ අදාල ආයතනයේ ගිණුම් විධිමත් පරිදි සසඳා නොතිබූ අතර පවතින වෙනස්කම් එළඹෙන මාසයේ මාසික ගිණුම් සාරාංශය මගින් නිවැරදි කිරීමට ද කටයුතු කර නොතිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේ වැය විෂයය 2401 න් කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා දරන ලද රු.1,396,765ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වල දක්වනවා වෙනුවට ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වල දක්වා තිබුණි.

1.6.3 ලේඛණ විධිමත්ව පවත්වා නොතිබීම

(අ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.947,954 ක බැරකම්, බැරකම් ලේඛනයක ඇතුලත් කර තිබුණත්, එහි බැරකම් නිරවුල්කිරීම සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කර නොතිබුණි.

(ආ) පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් පාලන ගිණුම් නිසි පරිදි ලියා, මාස්පතා භාණ්ඩාගාර පොත් සමඟ සැසඳිය යුතු නමුත් එසේ සසඳා නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.2,022,301 ක් වූ ශේෂය පෙන්වා නොතිබුණි.

2 මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී පසුගිය වර්ෂයේ වියදම් පිළිබඳව සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය සඳහා තාත්වික ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයන් 5 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසාගෙන තිබුණු එකතුව රු.13,300,000 ක් වූ ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ඇස්තමේන්තු මගින් එකතුව රු.7,400,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එම රු.20,700,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසා ගෙන තිබුණු රු. 600,000 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනයකර නොතිබුණි.

(ඇ) වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසා ගෙන තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පරිපූරක මගින් වැය විෂයයන් 02 ක් සඳහා ලබාගෙන තිබූ රු. 5,750,000 ක ප්‍රතිපාදන වලින් මුදල් රෙගුලාසි 66 න් රු. 767,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඈ) වැය විෂයයන් 06 ක් සඳහා සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 44 සිට සියයට 99ක් වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බැරකම් ප්‍රකාශයේ (සටහන iv) දක්වා තිබූ එකතුව රු.347,727 ක් වූ බැරකම් ශේෂයන් 03 ක් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ SA-92 ට ඇතුලත් කර නොතිබුණි.

(ආ) නිල රථ අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවිය යුතු රු.125,000 ක් බැදීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ (සටහන්III) ඇතුලත් කරනවා වෙනුවට මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන් IV) ඇතුලත් කර තිබුණි.

2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 104	මූල්‍ය ප්‍රකාශනවල සටහන් (II) යටතේ පෙන්වා තිබුණු වාහන අනතුරු 06 ක රු.6,348,644 ක් වූ අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 365 (3)	අග්‍රිමයන්ට අයත් මුදල් එයට නියමිත මුදල් වර්ෂයෙන් අන්‍ය වූ මුදල් වර්ෂයක ගෙවීම් පියවීම සඳහා යොදා නොගත යුතු බව දක්වා තිබුණත් 2022 ජනවාරි මාසයට නියමිත ඉන්ධන දීමනාව වූ රු.1,987,200 ක් අංක 429 දරන වවුචරයෙන් 2021 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණි.
iii. මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන සේවා කිරීම්, රු.මිලියන 12 ඉක්ම වූ වාහන අලුත්වැඩියා වියදම් සහ 2021 නොවැම්බර් 30 දින වන විට වාහන 12කට ටයර් යෙදීම වෙනුවෙන් දරන ලද රු.1,739,378 ක වියදම් ලොග් සටහන් පොත්වල සටහන්කර නොතිබූ අතර ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේආයතන සංග්‍රහයේXVIII වැනි පරිච්ඡේදයේ 2.2 වගන්තිය	අගව්නිසුරු නිල නිවස සඳහා ඉන්වෙන්ට්‍රි පොතක්, පරීක්ෂාවට ලක්කල හැකි පරිදි විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.1 වගන්තිය	ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ සිගාස් ඩෙක්ස්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර නොතිබුණි.

3.4 වගන්තිය	එක් එක් වැය විෂයය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය ව්‍යයම අතර වෙනස හා එම වෙනසට හේතු ඒසීඒ - 2 (II) ආකෘතියෙහි දැක්විය යුතු වූවත්, වැය විෂයයන් 2 ක ඉතිරි වීම් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි.
3.7 වගන්තිය	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සියලුම අගයන් ආසන්න රුපියලට වාර්තා කල යුතු වූවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සැකසීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06 ඡේදය	නිල වාහන සඳහා චක්‍රලේඛය මඟින් හඳුන්වා දී තිබුණු ප්‍රවාහන සේවා සටහන එක් එක් මාසයේ රාජකාරී සඳහා සම්පූර්ණ කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය ශීර්ෂ 04 හි ප්‍රතිපාදන මඟින් 2021 වර්ෂයේ මිල දී ගෙන තිබුණු රු.9,383,680 ක් වටිනා කාර්යාලීය උපකරණද, රු.5,595,188 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ද වැය ශීර්ෂ 234 ට අදාල බඩු වට්ටෝරු පොතට ඇතුලත් කර තිබුණු අතර වැය ශීර්ෂ 04 වෙනුවෙන් වෙනමම බඩු වට්ටෝරු පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ දී අධිකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු වාහනයක අයිතිය 2022 මාර්තු වන විටත් උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු ආයතනය වෙත විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. නමුත් කොමිට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාහන ලැයිස්තුවෙහි මෙම වාහනය ආයතනයට අයිති බව දක්වා තිබුණි.

4. යහපාලනය

අභ්‍යන්තර විගණනය සහ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම

2019 ජනවාරි 12 දිනැති අංක DMA/01 – 2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇති පරිදි මුදල් රෙගුලාසි 134 හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පරිච්ඡේදය 04 – කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අදාල නොවේ.

පරිච්ඡේදය - 05 – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

අදාල නොවේ.

පරිච්ඡේදය - 06 – මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ			
ශ්‍රේෂ්ඨාධිකරණය	17	17	_
අභියාචනාධිකරණය	20	20	_

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

- අදාල නොවේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

- අදාල නොවේ.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.6	වෙනත්			අදාළ නොවේ.
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
03.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම.(මු.රෙ.135)**			
3.1	ආයතනය තුල මූල්‍ය බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කර ගෙන තිබීම.			අදාල නොවේ
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහන ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.			
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.			
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිලිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.			අදාල නොවේ
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම.			අදාල නොවේ
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර තිබීම.			අදාල නොවේ
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.			අදාල නොවේ
07.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුල පවත්වා ගෙන තිබීම.			අදාල නොවේ
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක.01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම. සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම.	අනුකූල වේ		

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.			අදාල නොවේ
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.			අදාල නොවේ
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.			අදාල නොවේ
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.			අදාල නොවේ
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.			අදාල නොවේ
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කලයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම.	අනුකූල වේ		
12.	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූලවීම.	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.			අදාල නොවේ
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.			අදාල නොවේ
14	**අග්‍රිම ගිණුම**	අනුකූල වේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය	අනුකූල වේ		

	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.			
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.			අදාල නොවේ.
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.			අදාල නොවේ.
15.3	මු.රෙ.176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.			අදාල නොවේ.
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.			අදාල නොවේ.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.			අදාල නොවේ.
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක.04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.			අදාල නොවේ.
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		අදාල නොවේ.
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		අදාල නොවේ.
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		අදාල නොවේ.
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක.05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.			අදාල නොවේ.
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීකරණය කිරීම හා ඇගයීම සදහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.			අදාල නොවේ.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක.02/2018			අදාල නොවේ.

	ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල නහවුරු කොට තිබීම.			අදාල නොවේ.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.			අදාල නොවේ.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.			අදාල නොවේ.
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		